# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2297/56 – 2022 සැප්තැම්බර් 15 වැනි බ්‍රහස්පතින්දා – 2022.09.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR//10/89/2009.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.09.09 දිනැති හා අංක 1983/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.09.02 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් කළුතර උතුර, නව නීග්‍රෝධාරාම පාර, අංක 37 හි පදිංචි, එම්. ගුණපාල මයා සහ කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, අංක 50 හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.01.16 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 37488 – 11 (2022/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය- IR//10/89/2009.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

එම්. ගුණපාල මයා,
අංක 37,
නව නිග්‍රෝධාරාම පාර,
කළුතර උතුර.

(ඉල්ලුම්කාර පළමු පාර්ශවය)

නඩු අංකය: A /3659

*එදිරිව*

ලංකා විදුලිබල මණ්ඩලය,
අංක 50,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ - 02.
(වගඋත්තරකාර දෙවන පාර්ශවය)

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මහතා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2016.09.02 වැනි දින පත් කොට මෙම ආරාවුල මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වන්නේ ''ලංකා විදුලිබල මණ්ඩලයේ අධිකාරිවරයෙකු ලෙස සේවය කළ එම්. ගුණපාල මහතාට විශ්‍රාම වැටුප් හිමිකම් ලබා නොදීමෙන් අගතියක් සිදු වී ඇති බවට ඔහු විසින් කරනු ලබන ඉල්ලීම යුක්තිසහගත ද යන්න එලෙස යුක්තිසහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

මෙම බේරුම්කරණයට අදාළව ඉල්ලුම්කාර එම්. ගුණපාල මහතා ඉල්ලුම්කරුගේ නඩුව ආරම්භ කරමින් සාක්ෂි ලබා දෙමින් සිටින අතර රෝගාතුර වීම නිසා මෙම ඉල්ලුම් පත්‍රය බහා තබන ලෙසට ඉල්ලීමක් කර ඇත. ඒ අනුව වර්ෂ 2019.02.07 වන දින සිට මෙම ඉල්ලුම්පත්‍රය බහා තබා ඇත. ඉන් අනතුරුව වර්ෂ 2020.06.19 දිනැතිව බහාතබන ලද මෙම බේරුම්කරණය වර්ෂ 2020.08.25 දින සිට කැඳවන බවට දෙපාර්ශවයටම දැන්වීම් නිකුත් කර ඇත. වර්ෂ 2020.09.22 දින බේරුම්කරණය ඉදිරියේ පෙනී සිටි මොරුන්දගේ මංජුල ගුණදස මහතා තමා ඉල්ලුම්කාර එම්. ගුණපාල මහතාගේ පුත්‍රයා බවත්, ඉල්ලුම්කාර ගුණපාල මහතා අසනීප තත්ත්වය උත්සන්න වීම හේතුවෙන් 2019.06.10 දින මිය ගිය බවත් තමන්ට මෙම බේරුම්කරණය ඉදිරියට පවත්වා ගෙන යෑමට අවශ්‍ය බවත් ලේඛන ඉදිරිපත් කරමින් දැනුම් දෙන ලදී.

ඒ කෙසේ වෙතත් වගඋත්තරකාර පාර්ශවයෙන් ඒ සම්බන්ධයෙන් ඊට සිය විරෝධතාවය ප්‍රකාශ කළ අතර දෙපාර්ශවයම විසින් තම තමන්ට ඒ සම්බන්ධයෙන් ලිඛිත දේශණ ගොනු කිරීමට අවස්ථාව ඉල්ලා සිටි බැවින් දෙපාර්ශවයටම ඒ සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

වග උත්තරකාර පාර්ශවය වෙනුවෙන් මූලික විරෝධතාවයන් 2ක් ගොනු කර සිටින ලදී.

1. ඉල්ලුම්කාර එම්. ගුණපාල මහතා කළුතර මහ රෝහලේ දී වර්ෂ 2019.06.10 මිය ගොස් ඇති බැවින් මෙම බේරුම්කරණය අසා ප්‍රදානයක් ලබා දීමට නීතිමය බලයක් නොමැති බවත්,

2. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් හිමිකම විශ්‍රාම ගිය සේවකයාට මිස වෙනත් අයෙකුට හිමි නොවන බවත්ය, ඉල්ලුම්කරුගේ ලිඛිත දේශන මගින් ඉල්ලුම්කරු වෙනුවෙන් උරුමකරුවන් ආදේශ කිරීමට අවසර දෙන ලෙසත් ඉල්ලුම්කරු මිය ගිය දිනය දක්වා ඔහුට හිමි විය යුතු සහනයන් ලබා දෙන ලෙසත් ඉල්ලා ඇත.

මෙම මූලික විරෝධතාවයන් දෙකට අදළව වගඋත්තරකාර දෙවන පාර්ශවය, ඉල්ලුම්කරු මූලික සාක්ෂි ලබා දී හරස් ප්‍රශ්නවලට භාජනය වෙමින් සිටින අතර මිය ගොස් ඇති බැවින් ඉල්ලුම්කාර පළමු පාර්ශවය කියා සිටින කාර්මික ආරාවුල සනාථ වී නොමැති බවට කරුණු දක්වා ඇති අතර ඉල්ලුම්කරු හා සේවායෝජක අතර බලාත්මක කළ හැකි සේවා ගිවිසුමක් නොමැති බවටත් කරුණු දක්වා ඇත.

එසේම ඉල්ලුම්කරු මිය යාමෙන් පසුව කිසිදු පුද්ගලයෙකු ආදේශ කිරීමට හැකියාවක් නොමැති බවට වැඩිදුරටත් කරුණු දක්වා ඇත.

තවද කාර්මික ආරාවුල් පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව බේරුම්කරණයේදී ලබා දෙන ප්‍රදනයන් සේවායෝජක හා සේවකයා අතර පවතින සේවා ගිවිසුමේ ව්‍යංග කොන්දේසි බවට පත්වන බැවින් වලංගු සේවා ගිවිසුමක් නොමැති තත්ත්වයක් හමුවේ බේරුම්කරණයෙන් ප්‍රදනයක් ලබා දුන්නත් එය නිෂ්ඵල ක්‍රියාවක් වන බවට වැඩිදුරටත් කරුණු දක්වා ඇත. වගඋත්තරකරුගේ මුල් විරෝධතාවයට අදළව කරුණු සලකා බැලීමේදී 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 19 වගන්තිය වැදගත් වේ.

"Every award of an arbitrator made in an industrial dispute and for the time being in force shall for the purpose to this Act be binding all parties, Trade Unions, Employers and Workmen referred to in the award in accordance with the provisions of Section 17 (2); **and terms of the award shall be implied terms in the contract of employment between the employers and workmen** bound by the award ".

මේ අනුව බේරුම්කරණයේදී ලබාදෙන ප්‍රදනය එයට සම්බන්ධ සියලු පාර්ශවකරුවන් බැඳී සිටින අතර එම ප්‍රදනයේ නියමයන් සේවායෝජක හා සේවකයා අතර පවතින සේවා ගිවිසුමේ ව්‍යංග නියමයන් (Implied teams) බවට පත් වේ. ඒ අනුව මෙවැනි සේවකයකු මිය ගිය අවස්ථාවකදී වලංගු සේවා ගිවිසුමක් පවතින්නේද යන්න ඊළඟට සලකා බැලිය යුතු කරුණකි.

ගිවිසුමකට පාර්ශව දෙකක් හෝ කිහිපයක් තිබිය හැක. සාමාන්‍යයෙන් පුද්ගලයන් තම පෞද්ගලික මට්ටමින්, එසේ නැතිනම් නෛතික පුද්ගලයෙකු වශයෙන් ගිවිසුම්වලට එළැඹීම දකින්නට ඇත. (උද : සමාගම්, සමිති, සංගම්, රටවල්) ඒ අතරතුර සේවක - සේවා යෝජක ගිවිසුමකදී සේවකයා ඊට සම්බන්ධ වන්නේ පෞද්ගලික මට්ටමිනි. සාමාන්‍යයෙන් පෞද්ගලික මට්ටමෙන් සම්බන්ධ වන ගිවිසුමක දී පවා අදළ පුද්ගලයන්ගේ උරුමකරුවන්, පොල්මංකරුවන් ආදීනුත් සමග අදල පුද්ගලයා ගිවිසුමකට එළැඹෙන බවට දක්වා තිබේ. නමුත් රැකියාවක් සම්බන්ධ සේවක - සේවායෝජක ගිවිසුමකදී එවැනි ආකාරයේ නීතිමය යෙදීමක් දක්වන්නේ නැත. ඒ අනුව ඉන් හැඟී යන්නේ එම සේවකයාට පමණක් ඉන් වගකීමට බැඳෙන බවයි. එසේම එම සේවකයාගේ පැවැත්ම අවසන් වූ පසු එසේත් නැත්නම් එම සේවකයා මිය ගිය පසු එකී ගිවිසුමේ එක් පාර්ශවයක් මිය යාම මත සේවක - සේවායෝජක ගිවිසුම අවසන් වේ. එනම් වලංගු සේවක - සේවායෝජක ගිවිසුමක් තවදුරටත් නොපවතී. එසේම සක්‍රීය ගිවිසුමක් ද තවදුරටත් නොපවතී. එසේ සක්‍රීය වලංගු සේවක - සේවායෝජක ගිවිසුමක් නොපවතින තත්ත්වයක් හමුවේ ඉහත දක්වා ඇති 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 19 වගන්තියේ සඳහන් බේරුම්කරණ නියමයන් පරිදි සේවක - සේවායෝජක ගිවිසුමේ ව්‍යංග කොන්දේසි (Implied condition) බවට පත් වීමට හැකියාවක් නැත.

ශ්‍රේෂ්ඨාධිකරණ විසින් SC Appeal 22/2012 **මර්කන්ටයිල් ඉන්වෙස්මන්ට් ලිමිටඩ් Vs ජේ.ඒ. සුමිත් ආදිහෙට්ටි හා තවත් අය** නඩුවේ පහත පරිදි තීරණය කර ඇත.

" It is obvious that when an award is made the terms of the award becomes implied terms attached to the contract of employment, so there should be an existing contract of employment for the award to take effect at the time of making the award at the end of the arbitration.This section presupposes the existence of a valid contract between the employer and employee".

එසේම වලංගුව නොමැතිව අක්‍රීය සේවක සේවායෝජක ගිවිසුමක් මත ප්‍රදනයක් ලබා දුන්හොත් එය අවසානයේ ක්‍රියාත්මක කළ නොහැකිව ව්‍යාකූල තත්ත්වයක්ද ඇති විය හැක.

*The Superintendent Deeside Estate Maskeliya VS Liankai Thozhicar Kaznakan* (70 NLR 279) හිදී

" ....it is a fundamental principle that Court should not make an order which it can not enforced." ලෙසට දක්වා ඇත.

ඒ අනුව බේරුම්කරණ ක්‍රියාදාමයද අභියෝගයට ලක් විය හැකිය. මේ අනුව ඉල්ලුම්කරු මිය ගිය දිනය දක්වා හෝ යම් සහනයක් ලබා දී හැකි ද යන ඉල්ලුම්කරුගේ ස්ථාවරය අභියෝගයට ලක් වේ.

1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත හෝ ඊට අනුශාංගික අණ පනත්වල මිය ගිය ඉල්ලුම්කරුවකු වෙනුවෙන් ආදේශ කිරීමට ප්‍රතිපාදන නොමැති අතර ඊට අදාළ අධිකරණමය භාවිතයක්ද නොමැත. ඒ අනුව ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලා ඇති පරිදි මිය ගිය ඉල්ලුම්කරු වෙනුවෙන් ඔහුගේ උරුමකරුවන් ආදේශ කිරීමට හැකියාවක් නැත.

වගඋත්තරකාර දෙවන විරෝධතාවය වන්නේ සේවකයකු මිය යාම සමග විශ්‍රාම වැටුප් හිමිකම අවසාන වන බවයි.

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 56 වන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් වර්ෂ 2003ක් වූ දෙසැම්බර් මස 31 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබුණ ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම වැටුප රෙගුලාසිවලට අදාළව රීති 24:2 ප්‍රකාරව මිය ගිය සේවකයකුගේ විශ්‍රාම වැටුප් හිමිකම අවසන් වේ. එය ඔහු/ඇයගේ උරුමකරුවන්ට ලබාගත නොහැක. 24:2 මෙසේ දක්වා,

"Payment of monthly pension shall seize on the death of a pensioner, provided that in respect of the month in which death occurs the full months pension shall be paid."

මේ බව ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනයෙන්ද පිළිගෙන ඇත.

ඒ අනුව වගඋත්තරකාර දෙවන පාර්ශවයේ මූලික විරෝධතාවය පිළිගනිමින් මෙම බේරුම්කරණ විමසුම අවසන් කරමි. ඉල්ලුම්කාර පාර්ශවයට සහනයක් හිමි නොවන බවට තීරණය කරමි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට සහතික කරමි.

එස්. ලොකුබෝගහවත්ත,
බේරුම්කරු.

2022 ජනවාරි මස 16 වැනි දින,

EOG 09-0153

මගේ අංක : IR/COM/04/S/2014/79.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.04.07 දිනැති හා අංක 1961/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.04.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ත්‍රිකුණාමලය, ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (නැගෙනහිර), ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හි ආර්. ජේ. එම්. පී. ජී. වයි. බී. ජයසේකර මයා සහ රත්මලාන, ගාලු පාර, තැ. පෙ. 14 හි පිහිටි ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.03.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: IR/COM/04/S/2014/79.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

ආර්. ජේ. එම්. පී. ජී. වයි. බී. ජයසේකර මයා,
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානය (නැගෙනහිර)
ත්‍රිකුණාමලය.

*ඉල්ලුම්කාර පළමු පාර්ශවය*

එදිරිව

නඩු අංකය: A/3647

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
තැ. පෙ. 14,
ගාලු පාර,
රත්මලාන.

*වගඋත්තරකාර දෙවැනි පාර්ශවය*

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්ත්‍රිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2016.04.05 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

*ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :*

01. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මනු සටහන් පරීක්ෂක ලෙස සේවා කරනු ලබන ආර්. ජේ. එම්. පී. ජී. වයි. බී. ජයසේකර මහතා හට 2008.04.07 දින සිට පුහුණු කිරීමේ නිලධාරි තනතුර ලබාදෙන ලෙස කරනු ලබන ඉල්ලීම යුක්ති සහගත ද යන්න සහ

02. ඔහු 2008.04.07. දින සිට 2014.06.05 දින දක්වා පුහුණු කිරීමේ නිලධාරි තනතුරෙහි වැඩ ආවරණය කිරීම වෙනුවෙන් වැඩ ආවරණය කිරීමේ දීමනාව ලබාදෙන ලෙස කරනු ලබන ඉල්ලීම යුක්තිසහගත ද යන්න හා එලෙස යුක්තිසහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.

මෙම බේරුම්කරණයට අදාළ කාර්මික ආරාවුල කාර්මික ආරාවුල් පනත යටතේ සම්පාදිත 21(1) නියෝගය ප්‍රකාරව දෙපාර්ශවයේ සවිස්තරාත්මක ප්‍රකාශ දැක්වීමෙන් අනතුරුව පිළිතුරු ප්‍රකාශ ගොනු කිරීමේ අවස්ථාව ලබා දී සමථයක් නොමැති බවට වාර්තාගතකොට විමසුමට ගන්නා ලදී.

ඒ අනුව ඉල්ලුම්කාර පළමු පාර්ශවය වෙනුවෙන් ඉල්ලුම්කරු සාක්ෂි ලබා දී A1 සිට A36 දක්වා ලේඛන ලකුණු කරමින් ඉල්ලුම්කරුගේ නඩුව අවසන්කොට සිටි අතර වගඋත්තරකාර දෙවන පාර්ශවය වෙනුවෙන් කුමාර ඉද්දමල්ගොඩ, අතිරේක සාමාන්‍ය අධිකාරි (මානව සම්පත් කළමනාකරණ) මහතා සාක්ෂි ලබාදෙමින් R1 සිට R3 දක්වා වූ ලේඛන ලකුණු කරමින් වගඋත්තරකාර දෙවන පාර්ශවයේ නඩුව අවසන්කොට ඇත.

ඒ අනුව දෙපාර්ශවය හට තමන්ගේ ලිඛිත දේශන ගොනු කිරීමට අවස්ථාව සලසාදෙන ලද අතර දෙපාර්ශවයම ලිඛිත දේශන ගොනු කොට ඇත. කාර්මික අධිකරණය හා බේරුම්කරණය අධිකරණය බලය අත්පත්කර ගත්තේ විෂයභාර අමාත්‍යතුමාගේ යොමු කිරීමෙනි. එම යොමුව සමග ප්‍රශ්නගත සිද්ධියට අදාළව කම්කරු කොමසාරිස්තුමා විසින් සකස් කරනු ලැබූ ප්‍රකාශයක් ද එවනු ලැබ ඇත. එකී යොමුව හා ප්‍රකාශය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී ප්‍රධාන කොටස් තුනක් හඳුනාගත හැක.

01. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මනු සටහන් පරීක්ෂක ලෙස සේවය කරනු ලබන ආර්. ජේ. එම්. පී. ජී. වයි. බී. ජයසේකර මහතා හට 2008.04.07 දින සිට පුහුණු කිරීමේ නිලධාරි තනතුර ලබාදෙන ලෙස කරනු ලබන ඉල්ලීම යුක්තිසහගත ද යන්න,

02. ඔහු 2008.04.07 දින සිට 2014.06.05 දින දක්වා පුහුණු කිරීමේ නිලධාරි තනතුරෙහි වැඩ ආවරණය කිරීම වෙනුවෙන් වැඩ ආවරණය කිරීමේ දීමනාව ලබාදෙන ලෙස කරනු ලබන ඉල්ලීම යුක්තිසහගත ද යන්න,

03. එලෙස යුක්ති සහගත වන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න

පිළිබඳව වේ.

එම නිසා මෙම කාරණා 3 වෙන වෙනම සලකා බලමු. ඉල්ලුම්කාර සේවක මහතා තම ප්‍රකාශ ඉදිරිපත් කරමින් හා සාක්ෂි ලබාදෙමින් 2007 වර්ෂයේ සිට අනුමත වී තිබූ සේවක සැලැස්මට අනුව 2008 වර්ෂයේ අයදුම්පත් කැඳවා සුදුසුකම් පරීක්ෂා කොට තමන් ඒ සඳහා තෝරාගෙන 2008.04.02 දින සිට ආවරණ රාජකාරි සිදු කරනු ලැබූ බවට සාක්ෂි ලබා දෙයි.

ඒ සඳහා ප්‍රදේශයේ සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවා ඇති බව පෙනී යයි. (A6) ඒ අතරතුර ඉල්ලුම්කාර සේවක මහතා ඒ සඳහා නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි (නැගෙනහිර) ත්‍රිකුණාමලය විසින් මුල් වරට 2007.12.10 දින නිර්දේශ කර යවා (A4) ඔහුට රාජකාරියට වාර්තා කරන ලෙසත් පෙර රාජකාරිවලින් නිදහස් කරන ලෙසටත් දන්වා අනිකුත් අංශ ප්‍රධානීන්ට ද දන්වා යවා ඇත. (A5 හා A7)

නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි (නැගෙනහිර) ත්‍රිකුණාමලය ගේ නිර්දේශය නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි  (පිරිස් හා පාලන) ලැබුණ බව හෝ ඊට එකඟ නොවන බව හෝ ඒ සඳහා කටයුතු කරන බවට හෝ කිසිඳු ප්‍රතිචාරයක් දක්වා නැත. ඒ කෙසේ නමුදු නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි (නැගෙනහිර) ත්‍රිකුණාමලය විසින් 2008.06.17 දිනැතිව නැවත නිර්දේශ කරමින් නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි (පිරිස් හා පාලන) වෙත දන්වා යවා ඇත. (A8)

මේ අතරතුර වර්ෂ 2010ක් වූ ජුනි මස 22 දිනැතිව නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි (පාලන) මඩකලපුව විසින් නැවත නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි (පිරිස් හා පාලන) වෙතට නිර්දේශකොට යවා ඇත. (A9)

තවද වර්ෂ 2010.11.04 දිනැති ලිපිය (A22) මගින් ඉල්ලුම්කාර සේවක මහතා ද සාමාන්‍ය අධිකාරිතුමා තමන් පුහුණු කිරීමේ නිලධාරි තනතුරේ රාජකාරි කටයුතු ආවරණය කරනු ලබන බවත් එම තනතුරේ කටයුතු සාර්ථකව සිදු කිරීම සඳහා අවශ්‍ය වන මානව සම්පත් කළමනාකරණ පාඨමාලාවක් හැදෑරීම සඳහා පාඨමාලා ගාස්තු වශයෙන් රු. 90,000ක මුදලක් ඉල්ලා ඇත. ඒ සඳහා ඉල්ලුම්කාර සේවක මහතාගේ ඉල්ලීම පිළිගනිමින් ඒ සඳහා අවශ්‍ය මුදල් ද වග උත්තරකාර දෙවන පාර්ශවය විසින් මුදා හැර ඇත. එම පාඨමාලාවට අමතරව උපදේශන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා සාමාන්‍ය අධිකාරිතුමා වෙත ඉල්ලුම්කාර සේවක මහතා ඉල්ලුම්කොට ඊට අදාළ පාඨමාලා ගාස්තුව ද වග උත්තරකාර දෙවන පාර්ශවය ගෙවා ඇත. මෙම පාඨමාලා දෙකම ඉල්ලුම්කාර සේවක මහතා සාර්ථකව නිම කර ඇත. එසේම ඉල්ලුම්කාර සේවක මහතා පාඨමාලාවන් ගණනාවක්ම සාර්ථකව හදාරා ප්‍රවීනතාවය ලබාගෙන ඇත. මෙම සියලු පාඨමාලාවන් ඔහුගේ රාජකාරි සඳහා අඩු වැඩි වශයෙන් දායක වී ඇති බව පෙනී යයි.

වග උත්තරකාර දෙවන පාර්ශවය මේ සියලු අවස්ථාවන් හි දී ඉල්ලුම්කාර සේවක මහතා අදාළ ආවරණ රාජකාරි සිදුකරන බව දැන නොසිටියා වන්නට බැරිය. ඉල්ලුම්කාර සේවක මහතාට ඒ සඳහා සුදුසුකම් නොමැති නම් හෝ වෙනත් යම් නොහැකියාවක් තිබුණේ වී නම් ඒ බැව් දන්වා සිටින්ට වග උත්තරකාර දෙවන පාර්ශවයට හොඳහැටි අවස්ථාව තිබුණි. එසේම එය සිය වගකීම ද ඔවුන් දැරිය යුතුය.

නිසි පරිදි පත්වීම් ලිපියක් / පත්වීමක් ලබා නොදී යමෙකුගෙනක් සේවය ලබාගැනීම, වෙනත් සේවා ස්ථානයකට අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් අදාළ සේවකයාට කළ හැකි දෙයක් නැත. ඒ සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම් අදාළ සේවා යෝජකයාගේ ඉහළ නිලධාරින් ගත යුතුය.

මෙම ප්‍රශ්නගත සිද්ධිය හා ඊට අදාළ සම්පූර්ණ ක්‍රියාදාමය ව්‍යාකූලභාවයට පත්කරන්නේ සේවා වග උත්තරකාර දෙවන පාර්ශවයේ ඉහළ නිලධාරින්ය. එහි වගකීම ඔවුන් ගත යුතුය.

නිලධාරින් අතර වූ මේ වගකීම විරහිත ක්‍රියාදාමය නිසා අවසානයේ අපහසුතාවයට පත්වන්නේ කණිෂ්ඨ සේවකයන්ය. මේ ඉල්ලුම්කාර  සේවක මහතාට තමන්ට සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් දිගින් දිගටම ඉහළ කළමනාකාරිත්වය ඇතුළු රජයේ වෙනත් ආයතනවලට පැමිණිලිකොට අවදියෙන් සිට තමන්ගේ අයිතිවාසිකම් ගැන උනන්දු වී ඇත. ඒ අනුව නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ අභියාචනා කමිටුවට අභියාචනයක් මෙම බේරුම්කරණයට අදාළ විමසුම පවතින අතරතුර දී ඉදිරිපත් කොට ඇත. ඒ අනුව තිබූ අතර එම කමිටුවේ නිර්දේශය මත 2016.12.11 දින පැවැත්වීමට නියමිතව තිබූ ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීමට අවස්ථාව ඉල්ලුම්කාර පළමු පාර්ශවයට සලසා දී ඇත. (මීට ප්‍රථම ඒ සඳහා අවස්ථාව නොදුන්නේ වී නමුත්)

එකී ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූ ඉල්ලුම්කාර සේවක මහතා 2017.10.06 සිට ක්‍රියාත්මක වන පරිදි පුහුණු කිරීමේ නිලධාරි ii තනතුරට පත්කර තිබේ. ඒ අනුව මෙම බේරුම්කරණයට අදාළ යොමුවේ සඳහන් වූ පළමු එසේත් නැතිනම් ප්‍රධාන ගැටළුව / ආරවුල විසඳී ඇත.

එකී නව පත්වීම ලබාදීමෙන් පසුවත් තව දුරටත් සහනයක් බලාපොරොත්තු වන්නේ දැයි විමසීමෙන් අනතුරුව ඉල්ලුම්කාර පළමු පාර්ශවය යොමුවේ සඳහන් 2 වන ගැටළුව / ආරවුල සම්බන්ධයෙන් බේරුම්කරණයට ඉදිරියට පවත්වාගෙන යන බවත් විසඳුමක් බලාපොරොත්තු වන බවත් දන්වා සිටින ලදී. ඒ අනුව මෙම බේරුම්කරණය විසඳිය යුතුව ඉතිරි වූයේ ඉල්ලුම්කාර සේවක මහතාට තම සේවා ආවරණය කරන ලද කාලයට අදාළව යම් ආවරණ දීමනාවකට හිමිකම් ලබයි ද යන්න පමණි.

ඉල්ලුම්කාර සේවක මහතා හා වග උත්තරකාර සේවායෝජක ආයතනයට සම්බන්ධ වන්නේ අනියම් කම්කරුවෙකු වශයෙන් වන නමුත් 1995 වර්ෂයේ සිට 2022 වර්ෂය වන විට සේවය කරමින් සිටින අතරතුර සාමාන්‍ය උපාධියක්, පශ්චාත් උපාධියක්, ඩිප්ලෝමාවක් ඇතුළු තවත් වෘත්තීය සුදුසුකම් රාශියක් ලබාගෙන ඇති බව පෙනී යයි. එනම් තමන්ගේ රාජකාරිය වෘත්තීමය තත්ත්වයට උසස් කර ගැනීම අධ්‍යාපනය වෙනුවෙන් ඉහළ කැප කිරීමක් හා අවස්ථාවක් දී ඇති සේවකයෙකි. අඛණ්ඩව අධ්‍යාපනය ලබමින් දැනුම යාවත්කාලීන කරන එවැනි සේවකයන් ආයතනයකට සම්පත්ය. ඔවුන්ගෙන් නිසි අයුරින් වැඩ ගැනීමට ඉහළ බලධාරීන් වගබලා ගත යුතුය.

එසේම මෙම ඉල්ලුම්කාර සේවක මහතා උතුරු හා නැගෙනහිර දෙපළාතේ එල්. ටී. ටී. ඊ. යුද්ධය පැවති සමයේ වෙනත් නිලධාරීන් එවැනි පළාත්වල සේවය නොකරන අවස්ථාවක පවා සේවය කරනු ලැබූවෙක් වන අතර මාවිල්ආරු අමුණ වැසීම හේතුවෙන් ඇති වූ යුධමය තත්ත්වය හමුවේ වුවද ප්‍රදේශයේ ජනපදිකයන්ගේ ජල අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිට සේවා ඇගයීම පවා ලද්දෙක් වේ.

මේ නැගෙනහිර පළාතේ පුරප්පාඩුව පැවති පුහුණු කිරීමේ නිලධාරි තනතුර සඳහා නිලධාරියෙකු අනුයුක්ත කිරීම දිගින් දිගටම වග උත්තරකාර දෙවන පාර්ශවය අපොහොසත් වූයේ එකී ප්‍රදේශවල පැවති යුදමය වාතාවරණය නිසා විය හැකිය. එසේම යම් යම් වර්ෂවලදී අනුයුක්ත කරන නිලධාරීන් සේවයට වාර්තා නොකළ බවට කරුණු ඉදිරිපත්ව ඇත. ඒ අනුව බලන කල මෙකී ඉල්ලුම්කාර සේවක මහතා කර ඇත්තේ විශාල කැපකිරීමකි. ආදර්ශමත් සේවයකි. අගය කළයුතු සේවයකි.

ඉල්ලුම්කාර සේවක මහතා විසින් කරනු ලැබූ සේවයට ඔහුට පුහුණු කිරීමේ නිලධාරීන් බඳවා ගැනීමේ ලිඛිත විභාගයට ඉදිරිපත්වීමට විශේෂ අවස්ථාවක් සලසා දීම මගින් යම් පමණකට අගය කිරීමට ලක්වී ඇති බව පෙනී යයි.

ඒ කෙසේ නමුත් x ලෙස ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කරනු ලැබූ වර්ෂ 2018.02.05 දිනැති P4/18/පු ලි 36 යොමු අංකය යටතේ ගරු නීතිපතිතුමා වෙත යවනු ලැබූ ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලයේ ලිපියේ දක්වා ඇත්තේ (ii ඡේදය) ''සම්මුඛ පරීක්ෂණවලින් සමත්ව විධිමත් ලෙස රාජකාරි ආවරණය කරනු ලබන නිලධාරීන් විශාල සංඛ්‍යාවක් මණ්ඩලයේ සිටින අතර පවතින මූල්‍යමය තත්ත්වය මත මණ්ඩලයේ කිසිදු නිලධාරියෙකුහට මේ වන විට රාජකාරි ආවරණ දීමනා ගෙවීම් සිදු කරනු නොලබයි. පුහුණු කිරීමේ නිලධාරි තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති විධිමත් රාජකාරි ආවරණයට පත් කිරීමක් ද සිදුකර නොමැත. මෙම නිලධාරි මහතාට රාජකාරි ආවරණ දීමනාවක් ගෙවිය නොහැකි අතර එසේ සිදු කිරීම අනිකුත් සේවකයන් කෙරෙහි ද බලපෑමක් සිදු කරන පරිපාලනමය ගැටළු රාශියක් මතු කරන හේතුවක් විය හැක'' වශයෙනි.

මෙකී විශේෂ ලිපියෙන් මෙන්ම මෙම බේරුම්කරණය පුරාම ඉල්ලුම්කාර සේවක මහතාට නිසි රාජකාරි ආවරණ පත්වීමක් / ලිපියක් නොතිබූ බව වග උත්තරකාර දෙවන පාර්ශවය ගෙන හැර දක්වයි. ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි (නැගෙනහිර) ත්‍රිකුණාමලය නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරි (නැගෙනහිර) මඩකලපුව විසින් යවනු ලැබූ ලිපි මගින් බොහෝ දුරට සිදු කරනු ලැබ ඇත්තේ ආවරණ රාජකාරි පැවරීම සඳහා නිර්දේශ කිරීමකි. එසේම ජාතික ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලයේ නිසි පත් කිරීමේ බලධාරියා වන සාමාන්‍ය අධිකාරිවරයා කිසිදු පත් කිරීමක් සිදුකොට නැත.

නමුදු නියෝජ්‍ය සාමාන්‍ය අධිකාරිවරයා (නැගෙනහිර) ත්‍රිකුණාමලය විසින් නිකුත් කරනු ලැබූ බේරුම්කරණයේ දී A5 ලෙස ලකුණුකොට ඉදිරිපත් කරනු ලැබූ ලිපිය නිසි බලය ඇතිව නිකුත් කරනු ලැබූ පත්වීමේ ලිපියක් නොවන අතර පත්කිරීමක් සිදු කිරීමට අදාළ නිලධාරියාට බලය තිබිය යුතුය. එසේ නොමැති කල්හි යම් පත්කිරීමක් සිදු කළ ද එය බල රහිත බවට පත් වෙයි. ඒ බව ඉල්ලුම්කාර පළමු පාර්ශවය ද හරස් ප්‍රශ්නවලට භාජනය වෙමින් පිළිගෙන ඇත. (2018.11.28 දිනැති සාක්ෂි සටහන් පිටු 11 හා 12) එසේම වග උත්තරකරු වෙනුවෙන් සාක්ෂි ලබාදුන් අතිරේක සාමාන්‍ය අධිකාරී (මානව සම්පත් කළමනාකරණ) මහතා සිය සාක්ෂියේ දී මේ බව වැඩිදුරටත් තහවුරු කොට ඇත. (2019.08.19 සාක්ෂි සටහන් පිටු 6, 2021.12.17 සාක්ෂි සටහන් පිටු 2, 4, 6 සහ 8) එසේම නිසි බලයක් නොමැති නිලධාරියෙකු විසින් සිදු කරනු ලැබූ පත්වීම් නීතිය ඉදිරියේ වලංගුභාවයක් නොලබන බව Abeywickrama V Pathirana (1986) 1 SriLR120 හිදී මෙසේ දක්වයි.

"An Order or decision by and official who had no legal authority to make that order / decision is in law a nullity and is non-existent in the eyes of the law; such an order / decision is inoperative and void and it is open to court to declare that it is a nullity."

එසේම නිසි බලයක් නොමැතිව සිදු කරන ලද ක්‍රියා බල රහිත සහ බල ශූන්‍ය වේ. තවද නීත්‍යානුකූල නොවන දෙයක් මත නීත්‍යානුකූල අපේක්ෂාවක් (Legitimate Expectation) ඇති කරගත නොහැක. ඒ බව අපගේ විනිශ්චිත M. R. C. C. Ariyarathne and 93 others v The Hon. Attorney General and other SCFR 444/2012 හිදී මෙසේ දක්වා ඇත.

"that a representation not permitted by law and made ultra vires, cannot found a legitimate expectation ............ Next, as mentioned earlier, the law, as it presently stands, is that an assurance given ultra vires by a public authority, cannot found a claim of a legitimate expectation based on that assurance."

ඒ අනුව ඉල්ලුම්කාර පළමු පාර්ශවයට නීත්‍යානුකූල වලංගු පත්වීමක් හෝ වලංගු රාජකාරි පැවරීමක් නොමැති බව තීරණය කරමි. ඒ මත සාධාරණ දීමනාවක් ලබාදීමේ අවශ්‍යතාවයක් පැන නොනඟී.

ඒ කෙසේ වුවද ආවරණ රාජකාරි කළා යැයි කියනු ලබන කාලසීමාව තුළ දී ඉල්ලුම්කාර සේවක මහතා වග උත්තරකාර දෙවන පාර්ශවයේ මුදලින් පාඨමාලා ගණනාවක්ම හදාරා ඇති අතර ආයතනය විසින් යම් මුදලක් ඒ වෙනුවෙන් වැය කොට ඇති බව නිරීක්ෂණය වේ. එනම් ආවරණ රාජකාරි කළ කාලයේ දී ඉල්ලුම්කාර පළමු පාර්ශවයට යම් වරප්‍රසාදයක් ලැබී තිබේ.

ඒ අනුව ඉල්ලුම්කාර සේවක මහතාට ආවරණ රාජකාරි කළා යැයි කියනු ලබන කාලසීමාවට අදාළව ආවරණ දීමනාවක් ලබාදීමට තීරණය නොකරමි.

මෙය සාධාරණ හා යුක්තිසහගත තීරණයක් බවට සහතික කරමි.

2022 මාර්තු මස 28 වැනි දින.

එස්. ලොකුබෝගහවත්ත,
බේරුම්කරු.

EOG 09 - 0154

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.